ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යාංශය**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු ආරාධනයයි

## මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා සේවා සැපයීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) පලාත්භාර අධ්‍යක්ෂ (බස්නාහිර පලාත) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ **සභාපතිවරයා** විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ **ගම්පහ විධායක ඉංජිනේරු කොට්ඨාශය** වෙනුවෙන් පහත වැඩ කටයුතු සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

| අංකය | කොන්ත්‍රාත් අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය |
|---|---|---|---|
| 01 | RDA//PD(w)/TEN/GAM/01 | මාර්ග සංවර්ධන අධිකාරියේ **ගම්පහ විධායක ඉංජිනේරු කොට්ඨාශයට** අයත් උඩුපිල හන්දිය වාහන ප්‍රවාහනය සඳහා සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා | රු. 10,000.00 |

2. ක්‍රියාත්මක කරන නියෝජිතායතනය වන්නේ **මාර්ග සංවර්ධන අධිකාරියේ ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලයයි.**
3. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරනු ලැබේ.
4. **සෑම ලංසුවක්ම දක්වා ඇති වටිනාකමට පිළිගත් බැංකුවකින් සේවායා නමට ලබාගත් ලංසු සුරක්ෂණයක් සහිතව (2023.11.23 දක්වා වලංගු) ඉදිරිපත් කළ යුතුය.** ලංසු සුරක්ෂණ රහිතව ඉදිරිපත් වන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. ලංසු, කැඳවීමේ අවසන් දිනයේ සිට **දින 77** දක්වා වලංගු විය යුතුය.
6. 2023.08.02 සිට 2023.08.23 දක්වා පෙ.ව. 09.00 සහ ප.ව. 03.00 අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන රු. 1150.00 (වැට් සහිත) අයදුම්පත් ගාස්තුවක් ගෙවා පලාත්භාර අධ්‍යක්ෂ (බප) කාර්යාලය, **මාර්ග සංවර්ධන අධිකාරිය,අංක 36, උඩුමුල්ල පාර,** බත්තරමුල්ල ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.ලංසු ලේඛනය මිලදී ගන්නා විට මුල් ගෙවීම් පත්‍රිකාව ඉදිරිපත් විය යුතුය.1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුව, අයදුම්කරුවන් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිය යුතුය.**2023.08.24 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම විවෘත කෙරෙණු ඇත. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් විසින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.
7. පලාත්භාර අධ්‍යක්ෂ (බප) කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, **අංක 36,**උඩුමුල්ල පාර,බත්තරමුල්ල වෙතින් ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.
8. මුද්‍රා තබන ලද ලංසු, **පිටපත් දෙකකින්** යුතුව සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ පලාත් ප්‍රසම්පාදන කමිටුව,පලාත්භාර අධ්‍යක්ෂ (බප) කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, **අංක 36,**උඩුමුල්ල පාර,බත්තරමුල්ල වෙත, අවසන් දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදී ලැබීමට සැලස්විය යුතුය.කරුණාකර සෑම ලංසුවකම ඉහල වම් කෙළවරේ **ටෙන්ඩර් අංකය හා ටෙන්ඩරයේ නම** සඳහන් කල යුතුය.

9. වැඩි දුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 011-2863916, 011-2887357 ඔස්සේ කාර්යාල වේලාවන්හි දී බස්නාහිර පලාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

**සභාපති,**
**පලාත්භාර අධ්‍යක්ෂ (බස්නාහිර පලාත්) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**පලාත්භාර අධ්‍යක්ෂ (බප) කාර්යාලය**
**මාර්ග සංවර්ධන අධිකාරිය - නො 36, උඩුමුල්ල පාර, බත්තරමුල්ල**